# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

10 කාණ්ඩය 02 කලාපය

2024 මාර්තු

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු.70.00


## ලංකා - තායි නිදහස් වෙළඳ ගිවිසුම ව්‍යවස්ථා විරෝධීයි

ජනවාරි මාසයේ අත්සන් කෙරුණු බව කියන ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) ව්‍යවස්ථා විරෝධී, නීතිවිරෝධී සහ ශුන්‍ය සහ බල රහිත බවට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කරනු ලැබ ඇත.

ලංකාවේ නිල සංචාරයකට පැමිණි තායිලන්ත අගමැති 'ශ්‍රෙත්තා තාවිසින්'ගේ ප්‍රධානත්වයෙන් කොළඹදී පැවති නිදහස් සැමරුම් උත්සවයේදී මෙම තායි ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට අත්සන් තැබිණි.

නලින් ප්‍රනාන්දු වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා ලෙස එම ලේඛනයට සිය අත්සන තබා ඇත. තායිලන්ත රජය වෙනුවෙන් තායිලන්තයේ නියෝජ්‍ය අගමැති සහ වාණිජ අමාත්‍යවරයා ඊට අත්සන් තැබීය. 2024 ජනවාරි 24 දින කැබිනට් තීරණය නොතකා, පෙබරවාරි 3 වන දින ජනාධිපතිවරයා විසින් SLTFTA ගිවිසුම අත්සන් කර ඇත.

එකී ගිවිසුමට අනුව ශ්‍රී ලංකා රජය තායිලන්තයේ ජනතාවට ප්‍රතිලාභ ලබා දෙන රේගුවෙන් ලැබෙන ආදායම අඩු කරන බවත්, ඒ අනුව ශ්‍රී ලංකාවේ ජනතාවට පනවා ඇති වෙනත් බදු ගෙවීමෙන් ආදායම් අහිමි වීම සඳහා වන්දි ගෙවීමට සිදුවන බවත් පෙත්සමේ සඳහන් වේ. ඔවුන්ට සම්භවය පිළිබඳ නීතිරීතිවල ඕනෑම වෙනස් කිරීමක් සලකා බැලීමට සහ සම්මත කිරීමට ඉහත කී ගිවිසුම කොමිෂන් සභාවකට බලය ලබා දෙයි. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව එවැනි කිසිදු සංශෝධනයක් වලංගු ලෙස ක්‍රියාත්මක කළ නොහැක.

# ආණ්ඩුවේ පනත් වෙනුවට හොර ප්‍රතිපත්ති කරළියට

**Free Women!**



ජාත්‍යන්තර කාන්තා දිනය යෙදුණේ මාර්තු 8වැනිදාට වුවද නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය (Free Women!) මාර්තු 6,7,8 යන දිනවල නුවර, ගම්පහ හා ගාල්ල දිස්ත්‍රික්ක තුනේ පැවැත්වූ වැඩසටහන් මාලාවකින් එම දිනය හා සම්බන්ධ විය. පත්‍රිකා බෙදීම්, වීදි ගීත, වීදි නාට්‍ය, ජනහමු හා විරෝධතා සහිත වූ එම ක්‍රියාවලිය අතරතුර පාසල් දරුවන් වෙනුවෙන් පැවැත්වූ වීදි නාට්‍ය අවස්ථාවකි මේ.

**ආණ්ඩුව සිය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ජනතා විරෝධය තුළ පරාජයට පත්වීමේ අවදානම වැළැක්වීමට නව ක්‍රමවේදයක් අනුමනය කරමින් සිටින බව වාර්තා වේ. IMF කොන්දේසි ඉටු කිරීමේදී සහ විශේෂයෙන්ම මේ වනවිට ක්‍රියාවට නඟමින් තිබෙන අධ්‍යාපන පෞද්ගලිකරණය වැනි කාරණාවලදී වෙනදා මෙන් නීති ප්‍රතිසංස්කරණාවලට ඍජුව ගමන් නොකොට හොර පාරක් අනුගමනය කරන්නට බලධාරීන් පියවර ගෙන ඇත.**

සාමාන්‍යයෙන් ආණ්ඩු තමන්ට අවශ්‍ය පනත් පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීම හරහා නීති සම්පාදනය කරගනී. එහෙත් ජනතා ද්‍රෝහී පනත් කෙටුම්පත් ජනතාවගේ දැඩි විරෝධය නිසා ආණ්ඩුවලට හකුලා ගැනීමට සිදුවූ අවස්ථා ද ලංකා දේශපාලනයේදී දක්නට ලැබේ.

1982 සිටම සම්මත කරගැනීමට උත්සාහ කළ අධ්‍යාපන පෞද්ගලිකකරණයත්, දැන් මෑත කාලයේ මෙරට ස්වභාවික සම්පත් පුද්ගලික අයිතියට පවරාදීමේ උවමනාවත් වෙනුවෙන් ඊනියා 'ජාතික ප්‍රතිපත්ති රාමු' ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගැනීමට කුමන්ත්‍රණය අරඹා තිබේ.

අධ්‍යාපනඥයන්ගේ, ගුරුවරුන්ගේ ශිෂ්‍යයන්ගේ හා දෙමාපියන්ගේ අදහස් විමසීමකින් තොරව ලාභ අරමුණින් පමණක් සැලසුම් කළ ඊනියා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති

02 පිටුවට

## ලංකාවේ දරුවන්ගෙන් 16%කට මන්දපෝෂණය!

ලෝකයේ දරුණුතම ළමා මන්දපෝෂණ තත්වයන් වාර්තා වන රටවල් අතරට ලංකාවද ඇතුළත් වී තිබේ.

බ්‍රිතාන්‍ය ලැන්ස්ලෙට් වෛද්‍ය සඟරාවට අනුව ලංකාවේ වයස අවුරුදු 5-19 අතරේ දරුවන්ගෙන් 16.4%ක්ම මන්ද පෝෂණයෙන් පෙළෙයි. එම වයස් කාණ්ඩයේ ලංකාවේ ළමා ගහනයෙන් පිරිමි ළමයි 450,000ක් හා ගැහැණු දරුවන් 410,000ක් මෙලෙස මන්ද පෝෂණයට ලක්ව තිබේ.

දරුවන්ගේ උසට සරිලන බර, වයසට සරිලන උස, වයසට සරිලන බර ආශ්‍රිතව කරනු ලැබෙන මෙම සමීක්ෂණය ලොව පුරා රටවල් 199ක දරුවන් මිලියන 200ක් ආශ්‍රිතව සිදුකර තිබේ.

02 පිටුවට

## ලංකාවේ කෙරුවාව ගැන IMF ලොක්කන්ගේ සතුට!

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලංකාව සඳහා මෙහෙයුම් ප්‍රධානී පීටර් බෘවර් ඇතුළු කණ්ඩායමක් දෙසතියක විමර්ශන කටයුත්තක් සඳහා මෙරටට පැමිණ තිබේ.

ඒ IMF උපදෙස් මෙරට ක්‍රියාත්මක කර ඇති ප්‍රමාණය තහවුරු කර ගැනීමේ අරමුණෙනි. මේ සම්බන්ධව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සමග පැවැති ආරම්භක හමුවේදීම ලංකාව තම උපදෙස් ඉතා ඉහළ මට්ටමින් ක්‍රියාත්මක කර ඇති බවට පීටර් බෘවර් සිය සතුට ප්‍රකාශ කර සිටියේ ය. ඊට අදාළව නායකයන්ගේ දැඩි කැපවීම අගය කිරීමට ද ඔහු අමතක කළේ නැත.

ජනාධිපතිවරයාද IMF කණ්ඩායමේ හා ලංකා ආණ්ඩුවේ සාමූහික උත්සාහයකින් මේ

02 පිටුවට

## බැඳුම්කර හිමියන්ට බිලියන ගණන් ගෙවයි. ජනතාවට VAT!

ලංකාවේ ආණ්ඩුව දේශීය ණය ලබා ගැනීමේදී ප්‍රමුඛතම අවකාශය භාණ්ඩාගාර බැඳුම්කර හරහා සම්පූර්ණ කරගනියි. 2021 අප්‍රේල් 01ට පෙර මේ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලබා දුන් සාමාන්‍ය ප්‍රතිලාභ ප්‍රතිශතය උපරිම වශයෙන් 11% නොඉක්මවීය.

එහෙත් 2021 අප්‍රේල් 01 සිට 2023 සැප්තැම්බර් 15 දක්වා දේශීය වෙළඳපොලෙන් ලබාගත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සාමාන්‍ය ප්‍රතිලාභ ප්‍රතිශතය 27%ක පමණ වන ඉහළ අගයක් ලබා දී තිබෙ. එය සාමාන්‍ය ප්‍රමාණයට වඩා තුන් ගුණයක් ඉහළ අගයකි.

දේශීය ණය

02 පිටුවට

## ලංකාවට කොන්දේසි පැනවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට බලයක් නෑ!

දුමින්ද නාගමුව සහෝදරයා

ලංකාවේ ආර්ථිකය සම්බන්ධ ක්‍රියාත්මක වීමේදී කොන්දේසි පැනවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කිසිදු බලයක් නැති බව පෙරුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව

02 පිටුවට

මෙහි ඇති QR කේතය ඔබේ ජංගම දුරකථනයෙන් ස්කෑන් කර මෙමපුවතට අදාළ වීඩියෝව නැරඹීමට හැකිය.